
නෙත FM

5 පහේ පන්තිය

01 ලංකාවට ආවේණික සතෙක් වන්නේ මින් කවර සතා ද?

(1) මොනරා (2) උකුස්සා (3) දඬුලේනා

02 

මෙම මාළුවාගේ රූපය නිර්මාණය කිරීම සඳහා පාට දෙකක කඩදාසි පටි යොදා ගෙන තිබේ. මෙම කඩදාසි පටිවලින් මෙම රූපය සකස් කිරීමේ දී භාවිත කරන ක්‍රමය කුමක් ද?

(1) කඩදාසි පටි එක මත එක ඇලවීම

(2) කඩදාසි පටි පැදුරක් සකස් කරන අයුරින් ගොතා ගැනීම

(3) මාළුවාගේ දෙපසට පාට දෙකකින් කඩදාසි කැබලි දෙකක් අලවා ගැනීම

03 රුවන්වැලි මහ සෑය කර වූ රජතුමා කවු ද?

(1) දේවානම්පියතිස්ස රජතුමා (2) මහා පරාක්‍රමබාහු රජතුමා (3) දුටුගැමුණු රජතුමා

04 කුණු කසළ ප්‍රශ්නය විසඳා ගැනීමට අපට ගත හැකි හොඳ ම විසඳුම වන්නේ මින් කුමක් ද?

(1) කුණු වළවල්වලට පස් දමා වැසීම

(2) කුණු කසළ වර්ග කර බැහැර කිරීම


(3) කුණු කසළ සියල්ල ප්‍රාදේශීය සභාවට බාරදීම

05 ගොඩනැගිලිවල විදුලි බිල අඩු කර ගැනීම සඳහා කළ යුතු හොඳ ම දේ මින් කුමක් ද?

(1) රාත්‍රී කාලයට එම ගොඩනැගිලි ප්‍රයෝජනයට නොගැනීම

(2) හිරු එළියෙන් උපරිම ප්‍රයෝජන ලද හැකි පරිදි එම ගොඩනැගිලි සැලසුම් කිරීම

(3) අඩුවෙන් විදුලිය වැයවෙන බල්බ භාවිතය

06 

මෙම උපකරණය මගින් කම්බියක් කපා ගැනීමේ දී භාවිත කළ හැකි ස්ථාන දෙක කුමක් ද?

(1) A , C (2) A , B (3) B , C

07 

මෙම ඉස්කුරුප්පු ඇණය ගැළවීමට හෝ තද කිරීමට වඩාත් සුදුසු උපකරණය වන්නේ මින් කුමක් ද?

(1) පරීක්ෂකය (2) පැතලි ඉස්කුරුප්පු නියන (3) මල් ඉස්කුරුප්පු නියන

08 ගෙවත්තෙහි කාබනික පොහොර භාවිතය මගින් අපට සෞඛ්‍යමය අතින් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?

(1) පොහොර සඳහා යන මුදල් ඉතුරු වීම

(2) විස රහිත ආහාර ලබා ගැනීමට හැකි වීම

(3) කසළ කළමනාකරණයට විසඳුමක් ලැබීම

09 තවාන් දමා පැළ ලබාගෙන පසුව වගා බිමේ සිටුවන ශාකයක් වන්නේ මින් කුමක් ද?


(1) මෑ (2) බණ්ඩක්කා (3) මිරිස්

10 බෙදුණු ශාක පත්‍ර සහිත ශාකයක් නොවන්නේ මින් කුමක් ද?

(1) දෙල් (2) එඬරු (3) කරපිංචා

11 මලක් තිබිය යුතු හොඳ ම තැන වන්නේ මින් කොතැන ද?

(1) මල් පෝච්චියක (2) මල් කළඹක (3) එය අයත් මල් ගසේ

12 

මේ ආකාරයට පණිවිඩ හුවමාරු කර ගැනීම සඳහා වඩාත් සුදුසු පක්ෂියා වන්නේ මින් කවරෙක් ද?

(1) ගිරවා (2) පරෙවියා (3) මයිනා

13 අප නිතර ම විවිධත්වයෙන් යුතු මිශ්‍ර ආහාර වේලක් ලබා ගත යුතු වන්නේ ඇයි?

(1) එවිට ආහාර සඳහා යන වියදම අඩු කර ගත හැකි නිසා

(2) ශරීරයට අවශ්‍ය පෝෂණ පදාර්ථ සියල්ල ම ඒ මගින් ලැබෙන නිසා

(3) එවිට එක් එක් ආහාර හිඟ කාලයට ප්‍රශ්නයක් මතු නොවන නිසා

14 ආහාරයක් ලබා ගැනීමේ ප්‍රධාන අරමුණ විය යුත්තේ මින් කුමක් ද?

(1) කුසගිනි නිවා ගැනීම (2) දිව පිනවා ගැනීම

(3) ශරීරයට අවශ්‍ය ශක්තිය, වර්ධනය හා ආරක්ෂාව ලබා ගැනීම

15 පාසල තුළ පණිවිඩ යැවීමේ දී භාවිත කරන ක්‍රමයක් නොවන්නේ මින් කුමක් ද?

(1) සීනුව (2) ශබ්ද විකාශන යන්ත්‍ර (3) පුවත්පත් දැන්වීම්

16 වෙළෙඳ දැන්වීම් මගින් ලැබෙන තොරතුරු සම්බන්ධ ව අප සිහි තබා ගත යුතු ප්‍රධාන කරුණක් වන්නේ මින් කුමක් ද?

(1) එම කරුණු සියල්ල ම සත්‍ය බව

(2) එම කරුණු සියල්ල ම අසත්‍ය බව


(3) එම කරුණු තෝරා බේරා ගෙන වටහා ගත යුතු බව

17 හොඳින් රත්කළ ලෝහ හැන්දක් මතට ජල බින්දුවක් දැමූ විට ක්ෂණික ව ම සිදුවන්නේ කුමක් ද?

(1) ජලය වාෂ්ප වීම (2) ශබ්දයක් ඇති වීම (3) හුමාලය පිටවීම

18 පානය සඳහා නැවුම් සිසිල් ජලය ලබා ගැනීමට නිපද වූ උපකරණය කුමක් ද?

(1) පෝච්චිය (2) ගුරුලේත්තුව (3) ජෝගුව

19 

මෙම උපකරණය භාවිත කරන්නේ කුමන කර්මාන්තයක දී ද?

(1) පතල් කර්මාන්තය (2) කම්මල් කර්මාන්තය (3) වඩු කර්මාන්තය

20 විද්‍යුත් චුම්භකයක් භාවිත කර තනා ඇති උපකරණයක් වන්නේ මින් කුමක් ද?

(1) විදුලි ස්ත්‍රික්කය (2) විදුලි සීනුව (3) පාපැදිය

21 පාසල් සිසුන්ගේ ඇතැම් ක්‍රියා නිසා පාසල් පරිසරයේ සුන්දර බවට හානි සිදු වේ. සිසුන් සිදු කරන එබඳු වැරදි ක්‍රියාවක් වන්නේ මින් කුමක් ද?

(1) නිතර ම ක්‍රීඩා පිටියේ සෙල්ලම් කිරීම

(2) වැසිකිළි හා වෙනත් බිත්ති මත විවිධ දේ ලිවීම

(3) රංචු වශයෙන් පාසල් භූමිය තුළ හැසිරීම

22 භූමිය සරුසාර කරගැනීමට මෙන්ම ඖෂධයක් ලෙස ද අතීතයේ දී වටිනාකමක් ලැබුණු ශාකයකි.

(1) කුඹුක් ගස (2) මී ගස (3) කොස් ගස

23 ආහාර, ප්‍රමාණය ඉක්මවා තම්බා ගැනීමෙන් සිදුවන ප්‍රධාන ම හානිය කුමක් ද?

(1) ආහාරවල පෝෂණ ගුණය නැති වී යාම (2) ආහාරවල වර්ණය වෙනස් වීම

(3). ආහාර ඉක්මනින් නරක් වීම

24 

මෙම පූජනීය ස්ථානය පිහිටා ඇති පළාත වන්නේ මින් කුමක් ද?

(1) උඟව පළාත (2) මධ්‍යම පළාත (3) උතුරු මැද පළාත

25 ඩබ්ලිව්.ඩී.අමරදේව මහතාගෙන් විශාල සේවයක් සිදු වූයේ මින් කුමකට ද?

(1) නාට්‍ය කලාවට (2) සංගීත කලාවට (3) චිත්‍ර කලාවට

26 ලක් වැසියන් අතර ප්‍රචලිත ජන ක්‍රීඩාවක් වන්නේ මින් කුමක් ද?

(1) ක්‍රිකට් ක්‍රීඩාව (2) කටුව හැංගීමේ ක්‍රීඩාව (3) කබඩි ක්‍රීඩාව

27 අපට අසන්නට ලැබෙන බොහෝ අනතුරු, වළක්වා ගත හැකි අනතුරු ය. නමුත් ඒවා වළක්වා ගැනීමට නොහැකි ව ඇත්තේ කුමක් නිසා ද?

(1) නොසැලකිල්ල (2) අවාසනාව (3) උපකරණවල දෝෂ

28 නිදහසේ දැහැන, නිදහසේ මන්ත්‍රය ආදි කෘතීන් රචනා කළ ජාතික නිදහසේ අගය ගැන අප දැනුවත් කළ වීරවරයා මින් කවු ද?

(1) හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා (2) මාර්ටින් වික්‍රමසිංහ මහතා (3) එස්. මහින්ද හිමි

29 අප අවට පරිසරය පිරිසිදු ව හා පිළිවෙළට තබා ගැනීම මගින් අපගේ සිතට ලැබෙන ප්‍රයෝජනය වන්නේ මින් කුමක් ද?

(1) මැසි මදුරුවන්ගෙන් තොර පරිසරයක් ලැබීම (2) පරිසර දූෂණය අවම වීම

(3) ප්‍රියමනාප ප්‍රබෝධ ජනක පරිසරයක වැඩ කිරීමට ලැබීම

30 යමක් සාර්ථක කර ගැනීම සඳහා අපට තිබිය යුතු ම දේ කුමක් ද?

(1) මිල මුදල් (2) බඩු භාණ්ඩ (3) සැලසුමක්